*29 වන පිටුවෙන් (සම්ප්‍රදායික උත්සව)*

භුවනෙකබාහුගේ උදව් ඇතිව සීතාවක ආක්‍රමණය කළ බැවින් ආරක්‍ෂක හේතු මත දෙල්ගමු විහාරයට ගෙනැ යන්නට ඇත.

කන්ද උඩරට සීතාවක යටතට ගැනීමට මායාදුන්නේටවත් රාජසිංහයන්ටවත් නොහැකි විය. එක් පැත්තකින් පෘතුගීසීන්ටත් තව අතකින් කන්ද උඩරට කුමන්ත්‍රණකාරී විරුද්ධවාදීන්ටත් විරුද්ධව දෙයාකාර සටනක් මෙහෙව වන්නට තරුණ රාජසිංහට සිදුවිය. පෘතුගීසීන් ලංකාවෙන් පළවා හැරීමේ කාර්යය සපල කරගත නොහැකි වූයේ මේ හේතුවෙනි.

"වයස අවුරුදු එකොළහේ සිට සටන් බිමේ සිටි මා ඉදිරියේ කිසිම රජෙක් නොවීය. එහෙත් දැන් උඩරටට පැමිණ ඇත්තේ පින්වත් අයෙකි. මගේ පිං මහිමය ගෙවී අවසානය." ජීවිතය අවසානයේ රජතුමා පරාජය ඉවසා ගන්නේ එසේය. රාජසිංහයන් ගේ අවසන් කටයුතු සිදුවූයේද සාමන්‍ය මිනිසෙකුට වත් සිදුනොකරන අන්දමේ පහළ මට්ටමකිනි. උඩරට අන්තිම සටනින් පැරද ආපසු එද්දී පෙතන්ගොඩ උයනේදී රජුට තුවාලයක් සිදුවිය. කරවනැල්ලට පැමිණෙන විට රජු කොර විය. (කොරවුන ඇල්ල) කරවනැල්ලට පැමිණෙන වූ බව කියනු ලැබේ. ආපසු හැරී අඟුලෙන් කැළණි ගඟ දිගේ පහළට ගොස් ගඟ දිගේ ඉහළට යමින් සිටියදී කිකිළි බිත්තර වැල්ලේදී මරණය සිදුවිය. මෘත දේහය ගඟේ සිට කැපූ ඇල මාර්ගය ඔස්සේ පාකර ගෙනවුත් වැලිවිටියේ තැම්පත් කළ බව සඳහන් වේ. රජුට විරුද්ධව පැවති කුමංත්‍රණ යේ අවසාන අවස්ථාව මෙය නොවිය හැකිද කටුවක් ඇනී සුළු වේලාවකින් කොර උනේත් ඊට මඳ වේලාවකින් මිය ගියේත් අවසන් කටයුතු අමුතුම අන්දමකින් වහාම නිම උනේත් කවර හේතූන් නිසාද?

රාජසිංහයන්ගෙන් පසු සීතාවක රජකම හිමිඋනේ එල්ලාවල සිටි රාජසූර්ය කුමාරයාටයි. ඔහුගේ රාජ්‍ය කාලය තෙවසරකි. අනතුරුව පැලැඳද විසූ වේදය පතිරාජයන්ගේ බිසව පැමිණි නමුත් පෘතුගීසීන්ගේ බලය යටතේ ඇයද පරාජය වූවාය. අරිට්ට කී වෙණ්ඩු ගේ උපදෙස් ඇතිව නිකපිටියේ බණ්ඩාරද සුළුකලක් රාජ්‍ය කළ බවත් නිකපිටිය බණ්ඩාර ගේ සොයුරිය සමඟ විවාහ වීමට අරිට්ට කී වෙණ්ඩු කළ උත්සහය අසාර්ථක වූ බවත් සඳහන් වේ.

ඊට පසු පෘතුගීසීහු සීතාවකපූරය සම්පූර්ණයෙන් විනාශ කළහ. රජ මාලිග ාව ගින්නෙන් දවාලූහ. තල්දූවේ හෙරණ්ඩි දෙවොලද විනාශ කළත් කළුගල් වලින් කළ ගොඩනැගිල්ලක් නිසා පහළ කොටස් පමණක් ඉතිරිවිය. ඉතිරිවී ඇති ටිකත් ආත්මාර්ථකාමී මිනිසුන් ගේ ක්‍රියා නිසා ක්‍රමයෙන් විසිරී යනු දක්නට ඇත. සීතාවක පුරාණය පිළිබඳ යථාර්ථය සම්පූර්ණයෙන්ම වැලලී ගොස් ඇත. ජාතියේ ආඩම්බරයට පහළ වූ එහෙත් ජාතියේ අවාසනාව නිසා අකාලයේ විනාශ වී ගිය එඩිතර තරුණ නායකයකු පීතෘ ඝාතකයකු, සංඝ ඝාතකයකු බෞද්ධ විරෝධියකු හැටියට හඳුන්වා දෙනු ලැබ නාම මාත්‍රය පමණක් ඉතිරි වී ඇත. කෘතඥතාව පෙරදැරි කරගත් සාමාන්‍ය සිංහල ජනතාව අදත් සිද්ධ ගණේගොඩ දෙවි හාමුදුරුවන් නමින් විරාභිමාන ටිකිරි බණ්ඩාර රාජසිංහයන්ගේ දේවත්වයෙන් පුදති.

"ශත වර්ෂ එක්දහස් පන්සිය දාහතරක් වූ මැදින් මස පුර පසළොස්වක තිථියලත් බුද්ධ දින, ශ්‍රී ලංකාද්වීපය එකසත් කළාවූ ටිකිරි බණ්ඩාර රාජසිංහ මහ රජ්ජුරුවෝ එම සීතාවක මාලිගයේදී ඉකුත්ව කෛලාශප්‍රාප්ත වූහ."

"අලකේස්වර යුද්ධය"

විචාරකයෝ විමසත්වා



# සිනුවර හසුන

## සිඩ්නි සිට ලියමි

පසුගිය වසරේ මා සිනුවර හසුන ලියන්නට පටන් ගත්තේ, සිඩ්නි නුවර පිළිබඳ සොඳුරු තොරතුරු පොදුවේ සිටළු සන්නස පාඨකයින් ගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කිරීමටයි. නිසියාකාර භාෂා විලාශයක් මේ සඳහා භාවිතා කිරීමට ද මම මුල් වාරිකයේ සිටම වග බලා ගත්තෙමි. සන්නස කතුවරුන් ගේ කාරුණික අනුග්‍රහය යටතේ, පසුගිය මාස දහය තුල දී සිනුවර සාහිත්‍ය සහ කලා තොරතුරු සහ විවිධ අතුරු කතා ලියා ඉදිරිපත් කිරීමට සිනුවර හසුන තුලින් මට අවස්ථාව ලැබුණි. මගේ මූලික අරමුණු යම්තාක් දුරකට සාර්ථක වී ඇති බව මට මේ වන විට ලැබී ඇති ප්‍රතිචාර මගින් හැඟී ගොස් තිබේ.

අද මා සැරසෙන්නේ ද, සිනුවර පිළිබඳ සොඳුරු කලා පුවතක් ඔබට ගෙන එන්නටයි.

පසුගිය මැයි මස සන්නස කලාපයේ පලවූ සිනුවර කොලමේ සඳහන් වූ නිමල් වනිගසිංහ ලියා නිෂ්පාදනය කළ "ප්‍රතිමාවක් නැගූ කඳුලක්" වේදිකා නාට්‍යය ජූනි මස දහතුන්වෙනි ද සිනුවර තදසන්නයේ පිහිටි පැරමටා නගර ශාලාවේ දී නරඹන්නට මට අවස්ථාව ලැබුණි. තරුණ නාට්‍යකරුවෙක් ලෙස ශ්‍රී ලංකාවේ දී වේදිකා නාට්‍ය කිහිපයක් ම නිෂ්පාදනය කර ඇති නිමල් වනිග සිංහ සිනුවර දී කළ තුන්වැනි නිර්මාණය මෙය විය. හොඳ වේදිකා නාට්‍යයක් ලෙස නම් කල හැකි ප්‍රතිමාවක් නැගූ කඳුලක් නිර්මාණය පිළිබඳව පොදුවේ වැදගත් වෙන කරුණු කිහිපයක් සටහන් කර තැබීමට මම මෙහිදී අදහස් කරමි.

ප්‍රථමයෙන් ම කිව යුත්තේ, මේ නාට්‍යය නැරඹීමේ දී මට නැවතත් පසක් වූ එක් සොඳුරු සත්‍යයකි. එනම්, කලා කෘතියක් ඉදිරිපත් කිරීමට නිර්මාණකරුවෙකු කරන කැපවීමයි. මුහුදු හතක් එතෙර ඕස්ට්‍රේලියාවේ තබා, ලංකාවේ වත් සිංහල නාට්‍ය කලාවේ නිරත වෙන අයට ඇතිවෙන මහා ආර්ථික වාසියක් නම් නැත. මෙල්බර්න් පුරවරයට සාපේක්‍ෂකව ඉතා අඩු රසික පිරිසක් සිටින සිනුවර දී නම් නාට්‍යයක් නිෂ්පාදනය කිරීම යනු එක්තරා ආකාරයකට වක්කඩේ හකුරු හැංගීමකි. එක් වරක් පමණක් රඟ දැක්වෙන නාට්‍යයේ අවසන් ප්‍රතිඵලය ලෙස සමරු කලාපයකට සහ වීඩියෝ තැටියකට අමතරව ඉතිරි වෙන්නේ නිර්මාණය ට දයක වූවන් ගේ චිත්ත සංතෘප්තිය පමණි.

ශාලා ගාස්තු සහ නිෂ්පාදන වියදම් පියවීමට නාට්‍යකරුවාගේ නිවාස ණය ගිනුම උපකාර කරනවා විය හැක. නමුත් සැබෑ කලාකරුවා එයින් දුර්මුඛ නොවේ. ඔහු ගේ සදකාලික ප්‍රාර්ථනය යලි යලිත් නිර්මාණකරණයේ යෙදීමට යි. මීට වසර තුනකට ඉහත දී "පිනා සහ වලං කද" ගීතමය වේදිකා නාට්‍යය ඉදිරිපත් කළ නිමල් වනිගසිංහ යලිත් මෙලෙස අප හමුවට ආවේ ඒ නිසාය.

ප්‍රතිමාවක් නැගූ කඳුලක් නාට්‍යය නැවතත් සිනුවර දී ද, ඕස්ට්‍රේලියාවේ වෙනත් නගරයන් හි ද, වේදිකා ගත කිරීමට ඉඩකඩ ලැබේවා යැයි ද, අපේ නාට්‍යකරුවාගේ නිර්මාණාත්මක හැකියාවන් තවත් තියුණු වේවා යැයි ද මම ඉත සිතින් පතමි.

දෙවනුව මා මෙහි ලා සනිටුහන් කිරීමට කැමැත්තේ වේදිකා රංගනයට මනා හපන්කම් දක්වන සිනුවර කලාකරුවන් කිහිප දෙනෙකු පිලිබඳව ප්‍රශස්තියකි. ප්‍රතිමාවක් නැගූ කඳුලක් නිර්මාණයේ රඟපෑ නළු නිලියන් සියළු දෙනාම තම භූමිකාවන් ඉතා හොඳින් නිරූපනය කල බව කිව යුතුය. ඔවුන් ගේ රංගන කුසලතාවය නිෂ්පාදකයා ට තම කාර්යෙහි ලා මහත් පිටුවලක් වූවාට සැක නැත.

මෙහි ප්‍රධාන භූමිකාවන් ඉදිරිපත් කළ ශාන්ත වනිගතුංග සහ තුෂාරි කුලතිලක නාට්‍යය පුරාම වේදිකාව ඒකාලෝක කලහ. ඇමති චරිතය රඟ පෑ ජයන්ත රත්නායක ද විවිධ චරිත නිරූපනයෙහි ලා තමන් සතු මහරු වත්කම් මෙහිදී ද මනාව උපයෝගී කර ගත් බවක් පෙනුණි. සිය චරිත වල ස්වභාවය නිසාම වැඩි වේලාවක් වේදිකාව මත නිහඬව නිසලව ඉඳීමට සිදුවී තිබුනද, ප්‍රතිමා ලෙස රඟ පෑ සවීන්ද්‍ර මාවල සහ සම්පත් ජයවීර ඒ අජීවී ප්‍රතිමා නිසැකවම වේදිකාව මත සජීවී කළහ. රාජ පුරුෂයා ලෙස රඟ පෑ තිලක් රණසිංහ ද, දොරටුපාලයා ලෙස ඉතා කෙටි වුව ද තීව්‍ර රංගනයක යෙදුණු සිසිර අස්වැද්දුම ද තම රංග ප්‍රතිභාව මනාව හෙළි කළහ. නර්තන රචනය කරමින් නැටුම් කිහිපයක් ම ඉදිරිපත් කළ ජානකී ද සිල්වා ද, ඇගේ සහය නාට්‍ය ශිල්පිණිය වූ චාමිනි යශෝදරා ද වේදිකාව මතට ගෙන ආවේ ප්‍රබෝධයකි. අනාගතයේ මේ ශිල්පීන් ගේ දක්‍ෂ රංගනයන්, නර්තනයන් තව දුරටත් දැක බලා ගැනීමට හැකි වේවා යන්න මගේ නොමසුරු ප්‍රාර්ථනයයි.

මෙම ගීතමය නාට්‍යයේ සංගීතය ද පසුබිම් ගායනා ද හොඳ තත්වයේ විය.

ප්‍රතිමාවක් නැගූ කඳුලක් නිර්මාණයේ දක්නට ලැබුණු අඩුපාඩු ද සඳහන් නොකළොත් මේ සටහන සම්පූර්ණ නොවේ. නාට්‍යයේ කතාව ප්‍රභල වුවද, එය බොහෝ විට 80 දශකයේ සාකච්ඡා වුනු මාතෘකාවකි. එලෙසම නාට්‍ය පිටපත සහ ගීත රචනා උසස් මට්ටමේ වූවද, ගීතයෙන් කතාවේ ප්‍රධාන කොටසක් ඉදිරිපත් කීරීම මෙවැනි නිර්මාණයක් තුලින් කිරීම අසීරු බව මට හැඟුණි.

ආලෝකකරණයේ සහ ශබ්ද පරිපාලනයේ තිබූ දුර්වලතා සියල්ලට හේතුව නම් රංග ශාලාවේ පහසුකම් අඩුකම මිස අන් කිසිවක් නොවේ. වේදිකා නාට්‍යයකට සරිලන මනා පහසුකම් ඇති පැරමටා රිවර්සයිඩ් නර්තනාගාරය පෙනෙන නොපෙනෙන දුරින් තබාගෙන, මෙලෙස නිසි පහසුකම් නොමැති නගර ශාලාවේ මේ සිංහල ස්වතන්ත්‍ර නාට්‍යයේ මංගල දර්ශනය වේදිකාගත කරන්නට සිදුවීම වනාහී සිනුවර සිංහල රංග කලාව පිළිබද සත්‍ය තත්වයෙන් එක් අඩක් පිළිබඳ විස්තරයයි.

එද ඒ සීතල ශිශිර රාත්‍රියේ ප්‍රේක්‍ෂකාගාරයෙන් හරි අඩක්ම හිස්ව තිබීම ඒ කටුක සත්‍යයේ අනිත් අර්ධයයි.

ලබන මාසයේ නැවත හමුවෙමු.

*සිනුවර ආරච්චිල*

<sinuwara.arachchila@gmail.com>


# EDTracK Institute

**"We Make Your Kids Smarter!!!"**

## Maths/English at Caroline Springs/ Broadmeadows

- Group classes- 8 students only.
- Classes start after school holidays (18th July 2009 Saturday)
- Held by Victorian Institute of Teaching registered experienced Primary School /Highs School Maths/ English Teachers

**Western Suburb class at Brookside community Centre, Caroline Springs on Saturdays and Hume Global Learning Centre on Sundays , Broadmeadows**

Caroline Springs Classes - Saturdays

| English | | Maths | |
|---|---|---|---|
| Year 3-4 | 1.00pm-2.00pm | Year 7 | 1.00-2.00pm |
| Year 5-6 | 2.00pm-3.00pm | Year 8 | 2.00- 3.00pm |
| Year 7-8 | 3.15pm- 4.15pm | Year 5-6 | 3.15-4.15pm |
| Year 9-10 | 4.15pm- 5.15pm | VCE | 4.15-5.15pm |
| VCE | 5.15pm-6.15pm | Year9-10 | 5.15-6.15pm |

Broadmeadows Classes - Sundays

| English | | Maths | |
|---|---|---|---|
| Year 3-4 | 1.00pm-2.00pm | Year 7 | 1.00-2.00pm |
| Year 5-6 | 2.00pm-3.00pm | Year 8 | 2.00- 3.00pm |
| Year 7-8 | 3.15pm- 4.15pm | Year 5-6 | 3.15-4.15pm |
| Year 9-10 | 4.15pm- 5.15pm | VCE | 4.15-5.15pm |
| VCE | 5.15pm-6.15pm | Year9-10 | 5.15-6.15pm |

- Classes for both Primary school and Secondary school children
- Special classes for learning difficulty students.
- Specialised school entry exams.
- VCE classes Maths/English/Physics/Chemistry/Accounting

saamArt

**Register early .... Limited vacancies available per class !**

**Maths Teachers: Mano Perera, Debra Hudson, Tony Hunter**

**English Teachers: Dora Costa, Mark Lowry, Sara Newman**



**All Inquires:**
**Mano Perera**
**B.Sc. , Grd Dip (Edu), Dip Acc.**
**Ph. : (03) 9010 6133**
**(03) 8361 7716 or**
**04300 79560**
Email. :
pereramano@gmail.com or
Perera.mano.m@edumail.vic.gov.au

Edtrack Education